# මගේ ආදර පවසට

මව් බිමේ නිදහස් අධ්‍යාපනයේ නාමයෙන් හැණ නුවන පාදා ගත් උගත් විද්වතුන් කොපමණ පිරිසක් විදා මෙදා තුර ලක් බිමෙන් බිහි වී ඇති ද? රටේ පවතින විවිධ දුෂ්කරතා හේතුවෙන් බුද්ධිගලනය වීම මව්බිමට බලපෑවේ අද ඊයෙක සිට නොවේ. එලෙසින් විදෙස් ගතවන උගත්, විදත් පිරිස තමන්ට විදා නිදහස් අධ්‍යාපනයක් ලබා දීමට දායක වූ ප්‍රජාව පිළිබඳව කෘතවේදීව කටයුතු කරනු දක්නට, ඇසීමට ලැබීම සැබවින්ම සතුටට කාරණයකි.

ඕස්ට්‍රේලියාවේ සිටිනා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය වෙතින් මව් බිමේ නැති බැරි අහිංසක දුවා
දරුවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම එවන් වටිනා සත්කාර්යකි. විදා තමන්ට පිහිට වූ පිරිසකගේ තවත් එක් පරපුරක් වෙනුවෙන් අරමුදල් රැස් කර, ඉන් ඔවුනට පිහිට වීම සැබැවින් ම අගය කළ යුතුයි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයීය ඕස්ට්‍රේලියානු ආදි ශිෂ්‍ය සංගමය දොයානාරයකට මෙලෙස ශිෂ්‍යත්ව පිරිනමයි. සිය විශ්ව විද්‍යාලීය විද්‍යාර්ථීන් වෙනුවෙන් එක් අයෙකුට වසරකට රුපියල් 25000 බැගින් පිරිනැමීම පළමුවැන්නයි. මේ වන විට මව්බිමේ තැන්පත් කර ඇති රුපියල් කෝටියකට ආසන්න මුදලේ පොලියෙන් මෙම සත්කාර්ය ඉටු කරගෙන යන බැව් දැන ගැනීමට ලැබිණ.

ආදි ශිෂ්‍ය සංගමයට දස වසරක් සැපිරෙන මේ වසරේ පාසල් දරුවනට රුපියල් 12000 බැගින් වසරකට පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා වන නව අරමුදල වෙනුවෙන් "මගේ ආදර පවසට" නමින් සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට විධායක කමිටුව ඇතුළු සාමාජිකයෝ සූදානම් වෙති. ප්‍රවීණ හා ජ්‍යේෂ්ඨ ගායන ශිල්පිනී ඉන්ද්‍රාණී බෝගොඩ සහ ප්‍රවීණ ගායන ශිල්පී ක්‍රිෂාන්ත එරන්දක යන කලාකරුවන් සජීවීව ගායනා කරන මේ ප්‍රසංගය පැවැත්වෙන්නේ 2019 ජූනි 2 වන දා, බර්වුඩ් ප්‍රදේශයේ "මීසන් සෙන්ටර්" ශාලාවේ දීය.

මාතර කොළිඤ්ජවිල ප්‍රදේශයේ බෝගොඩ නමින් සංගීතයට ප්‍රසිද්ධ පවුලක උපන් ඉන්ද්‍රාණී දැරිය සතර දෙනෙකුගෙන් යුත් පවුලේ තෙවැන්නියයි. වැඩිමල් ම සොයුරා විශාරද චන්ද්‍රදාස බෝගොඩ මහත්මා කථිකාචාර්ය වරයෙකි. ඉන්ද්‍රාණී බෝගොඩ ශිල්පිණියගේ සංගීත ගුරුවරයා වූයේත් ඔහු මයි. ඇයගේ ගීත වලින් 80% ක ම නිර්මාණයන් ඔහුගේ ම යි. දෙවැන්නා වන රංජිත් බෝගොඩ මහතා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ දක්ෂ තබ්ලා වාද්‍ය ශිල්පියෙකි. නැගණිය, චන්ද්‍රා බෝගොඩ මහත්මිය සංගීතාචාර්ය වරියකි.

1970 දශකයේ මුල් කාලයේ සිය බාප්පා වන සෝමපාල බෝගොඩ ගායන ශිල්පියා සමඟ ගීත දෙකක් ගයමින් ඉන්ද්‍රාණී බෝගොඩ යොවතිය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට සම්බන්ධ වන්නී, පසුව සරල ගී පරීක්ෂණයට පෙනී සිටිමින් "ඒ" ශ්‍රේණියේ සරල ගී ගායිකාවක බවට පත්වන්නීය. "ගීත තරංගනී" "නව පද මාලා" , "ස්වර වර්ණ" , "රාගධාරා" , "නව නිර්මාණ" වැනි ගුවන් විදුලි වැඩසටහන් තුළින් පියෙන් පිය නගනා ඇය "සිත දිය රැල්" , "සිරිමා බෝපත් චාමර සැලෙනා" , "පෙම් කළ වරදට" , "මගේ නිල නෙතු සඟලින්" , "නිල වර්ණ" , "විදුලිය එළිය" , "සිඟිරි කාව්‍යලතා" , "මා හිස පිරිමැද" , "මා ප්‍රිය හිමියනි" , "සූර්යකාන්තා", මොනාලිසා" වැනි අතිශය ජනප්‍රිය ගී ගොනුවක ගායන හිමිකාරිය බවට පත් වූවාය.

සන්නස

විශාරද ඩී. ෂෙල්ටන් පෙරේරා, විශාරද අමරසිරි පීරිස්, ආචාර්ය වික්ටර් රත්නායක, අබේවර්ධන බාලසූරිය, රෝහණ සිරිවර්ධන, සෝමතිලක ජයමහ, වැනි ප්‍රවීණයින් සමඟ යුග ගී ගයා ඇති ඉන්ද්‍රාණී බෝගොඩ ගායන ශිල්පිණියගේ හඬෙහි ඇති අනන්‍යතාව ඇයව මේ සා දුරක් කැඳවාගෙන ඒමට හේතුව විය. ගුවන් විදුලියත් ගී රචකයින් පෙළත්, තනු නිර්මාපකයින් සැමත් ඇය නිරතුරුව සිහිපත් කරන්නේ ස්තූති පූර්වකවයි.

විශාරද ගුණදාස කපුගේ සංගීතවේදියාණන් මුල් වී රජරට ගුවන් විදුලි සේවයෙන් ඉදිරිපත් කළ "ප්‍රභාෂ්වර" වැඩ සටහනින් දොරට වැඩි අවසන් ගායන ශිල්පියා ලෙසින් ක්‍රිෂාන්ත එරන්දක යොවනයා හැඳින්විය හැකියි. එනයින්, රජරට ගායක නාමාවලියේ අවසන් නාමය වන්නේ " ක්‍රිෂාන්ත එරන්දක " නමයි. ක්‍රිෂාන්ත ගායන ශිල්පියා සතු තමන්ට ම ආවේණික වූ සෞම්‍ය ගැමි හඬ ගී සෝත්‍රයේ වෙනම ම කැපී පෙනෙනා, රසික මනසයේ සටහන් වන හඬක් වෙයි.

"ඒ පැතුමෙන්" ගීත සමුච්චයේ සිට සිය අවසන් සංගත තැටිය වන "නවාසැන්පොළ" දක්වාත්, ඉන් පසුව කළ නිර්මාණවලත් අර්ථවත් බව හා නිර්මාණාත්මක බව එක සේ පවත්වා ගැනීමට ක්‍රිෂාන්ත එරන්දක ශිල්පියා උනන්දු විය. නොයෙකුත් ප්‍රවණතා මධ්‍යයේ වුවද නො වෙනස්ව සිය අනන්‍යතාව රැක ගනිමින් කළ ගී අතර " ඒ පැතුමෙන්" ,"ඔන්දාරම් අඳුර මැදින්" , "පංච කල්‍යාණියේ" , "මගේ ආදර පවසට", "අච්චේ මුතු ඇට වපුරා" , "මලට මුදු ගුණ" . "හිමුළුලේ නිල දෙන්න මට", "මල් පිපෙනා වසන්තයට", "අහසක් නැත පොළොවක් නැත", "ඉන්මන් නොවුණා නම්" , "හිරි ඉද්ද ගහට" , "රෝස මලට කියනවාද" , "මේ නිහඬ බව විඳෙන්න" වැනි ගීත කැපී පෙනෙයි.

ඉන්ද්‍රාණී බෝගොඩ සහ ක්‍රිෂාන්ත එරන්දක ශිල්පීන් ගේ සජීව ගායනා විඳුමින් අර්ථවත් සත්කාර්යයකට දායක වීමට රසික ප්‍රේක්ෂකයින් හට ලැබෙන කදිම අවස්ථාවකි, "මගේ ආදර පවසට" ප්‍රසංගය. 2019 ජූනි 2 වන සෙනසුරාදා සවස 6.00 බර්වුඩ් ප්‍රදේශයේ "ස්ටේෂන් ස්ට්‍රීට්" හි අංක 87/89 ස්ථානයේ "මීසන් සෙන්ටර්" ශාලාවේ පැවැත්වෙන එම ප්‍රසංගය විඳීමට එක් වන මෙන් සංවිධායක මණ්ඩලය රසික පාඨක ඔබ සැමට ආරාධනා කරයි. ඔවුනගේ සත්කාර්යය සාර්ථක වේවා යි සන්නස මාසිකය ප්‍රාර්ථනා කරන අතරම විධායක කමිටුව වෙනුවෙන් අපව දැනුවත් කළ සමිත් චිත්‍රනායක මහත්මාට ස්තූති වන්නෙමු.

